# ක්‍රි.ව. 8 වන සියවසේ සිට 19 වන සියවස දක්වා මුස්ලිම්වරුන් හා ලංකා රාජ්‍යය අතර පැවති සබඳතාවය

එම්. ඩබ්. නුවන් තාරක සුමනසේන
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nuwan.medawattha@gmail.com

**සංක්ෂේපය**

ඈත අතීතයේ සිටම ශ්‍රී ලාංකිකයන් විදේශිකයන් සමඟ විවිධ සබඳතා පැවැත්වූ අතර, අරාබීන් හෙවත්, මුස්ලිම්වරුන් සමඟ පැවැති සබඳතා සුවිශේෂී ස්ථානයක් ගනු ලබන්නේය. මෙම අධ්‍යයනයේදී අරමුණ වන්නේ විදේශීය ජන වර්ගයක් වූ මුස්ලිම්වරු වෙළඳාම සඳහා ලංකාව කේන්ද්‍රීය වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත් කළ ආකාරය ද ඔවුන්ගේ වෙළඳාම, රාජ්‍ය සබඳතා, පාලන කටයුතුවලට සහභාගීත්වය හා සංක්‍රමණ පිළිබඳ විමසා බැලීමයි. මූලාශ්‍රයවල සඳහන් පරිදි ඔවුන්ගේ ඉතිහාසය ඈත අතීතයට දිව යන නමුදු ක්‍රි.ව. 8 වන සියවසේ සිට 19 වන සියවස දක්වා ලාංකිකයන් හා මුස්ලිම්වරුන් පවත්වාගෙන ආ සබඳතා කෙසේ සිදු වීද යන්න විමසා බැලීම මෙහි ලා ප්‍රමුඛ වේ.

පර්යේෂණ ක්‍රමවේදය ලෙස සාහිත්‍යමය මූලාශ්‍රයන් වන ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීය මූලාශ්‍රය අධ්‍යයනය කෙරුණු අතර, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ද අධ්‍යයනය කෙරිණි. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය ඉන්දියන් සාගරයේ අරාබි වෙළඳම හා බැඳී පවතින අතර ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග ගොඩබිම් හා මුහුදු සේද මාවතේ ප්‍රධාන වෙළඳ කේන්ද්‍රස්ථානයක් ලෙස පැවතීමද, ස්වභාවික වරායන්හි පිහිටීමද, හිතකර දේශගුණික තත්වයන් ද වටිනා වෙළඳ භාණ්ඩයන් වන මැණික්, ඇත්දත් හා කුළු බඩු වැනි දෑ මෙරටින් පහසුවෙන් සපයාගත හැකි වෙළඳපලක් වීමද, මෙරට පාලකයන්ගේ ආගමික සහනශීලීතාවයද යන කරුණු පදනම් කර ගනිමින් මුස්ලිම්වරු තම වෙළඳ සබඳතා ලංකාව දෙසට යොමු කළේය. මුස්ලිම්වරුන්ගේ වෙළඳාම තුළින් මෙරට ඇති වූ ප්‍රතිඵල ද ඔවුන්ගේ සභ්‍යත්වය ලංකාව තුළ ව්‍යාප්ත වූ ආකාරය ද පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යුගයන්හි ගොඩනැගුණු ගැටීම් හා රාජ්‍ය සබඳතා කුමන ආකාරයෙන් සිදු වීද යන්න ද, පසුව මුස්ලිම්වරු ලාංකීය සමාජයේ කොටස්කරුවන් වීම පිළිබඳව තොරතුරු රාශියක් අධ්‍යයනයේදී සොයාගත හැකි විය. මේ අනුව මුස්ලිම්වරුන්ගේ ආගමනය හේතුකොටගෙන අරාබිකරයේ පැවති දියුණු වෙළඳ ප්‍රතිපත්තියක් මෙන්ම ලාංකීය සමාජය තුළ දේශපාලන, ආගමික හා සමාජීය ක්ෂේත්‍රයන්හි වෙනසක් ඇති කරන්නට මුස්ලිම්වරුන් සමත් වී ඇති බව අවබෝධ කර ගත හැකිය.

**ප්‍රමුඛ පද : මුස්ලිම්වරු, වෙළඳාම, ශ්‍රී ලංකාව, දේශපාලනය, සමාජය.**